

# ශ්‍රී සද්ධර්මෝවාදය.

# ශ්‍රී සද්ධර්මෝවාදය.

# Sri Saddharmowadaya.

## මරණ සතිය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

සබ්බෙ සඞ්ඛාරා අනිච්චාති-යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ-එසමග්ගො විසුද්ධියා

කාමභවාදියෙහි උපන්නාවූ පඤ්චස්කන්ධයයි කියනලද සියලු සංස්කාරයෝ ඒ ඒ භවයෙහිම ඉපද නස්නා හෙයින් අනිත්‍යයවෙත්. යම් කලෙක්හි විදර්ශනා ප්‍රඥාවෙන් දකිද, එකල්හි යම් ස්කන්ධ පරිහරණයයි කියනලද දුක්ඛයෙහි කලකිරෙන්නේය. එසේ කලකිරුණෝ දුක් පිරිසිඳ දැනීම් ආදියෙන් දුක්ඛ සත්‍යය, සමුදය සත්‍යය, නිරොධ සත්‍යය, මාර්ග සත්‍යය යන චතුරාර්‍ය්‍ය සත්‍යය ධර්ම ප්‍රතිවෙධ කරන්නේය. එසේ හෙයින් මේ සංස්කාරයන් කෙරෙහි කලකිරීම පිරිසිදු බවට නොහොත් නිර්වාණයට මාර්ගය වන්නේයයි කියා මේ ගාථා ධර්මයෙන් අප තථාගත ශාක්‍ය මුනීන්ද්‍රයාණන් වහන්සේ විසින් වදාරණ ලද්දේය.

එසේ හෙයින් ශාන්ත ප්‍රණීතවූ පරම රමණීයවූ නිර්වාණ සිරි විඳිනු කැමති සියලු සත්පුරුෂ ජනතාවගේ උපස්ථාන ගාමිනී විදර්ශනාව ලැබීමට නොහොත් සසර කතරින් එතරවීමට උපනිශ්‍රයවන මෙම මරණ සතිය භාවනා වශයෙන් වැඩිය යුත්තේය.

"මරණන්ති එක භව පරියාපන්නස්ස ජීවිතින්ද්‍රියස්ස විච්ඡෙදො" යනාදීන් මරණයනම් එක් භවයකින් පිරිසිඳිනලද ජීවිතෙන්ද්‍රිය පරම්පරාවගේ සිඳීමයි. ඒ මරණය වනාහි ආයුෂාදීන්ගේ ක්ෂය කාලයෙහි වන කාල මරණය, ආයුෂාදීන්ගේ ක්ෂය නොවීමෙන් වන අකාල මරණයයි දෙවැදෑරුම්වේ.

ඒ දෙවැදෑරුම් මරණයන් අතුරෙන් කාල මරණය සුගති දුර්ගති දෙක්හි පූර්ව ජනක කුසලාකුසල කර්මය ගෙවීමෙන් හෝ ආයුෂ ගෙවීමෙන් හෝ වන්නේය. අකාල මරණය උපච්ඡෙදක කර්ම වශයෙන් වන්නේයි- ඒ දෙවැදෑරුම් මරණයන් අතුරෙන් ජීවිතෙන්ද්‍රිය පරම්පරාව පැවැත්වීමට කාරණාවූ ආහාරාදි ප්‍රත්‍ය සම්පත්තිය ඇතත් හුදෙක් ප්‍රතිසන්ධිය ගෙන දුන් ජනක කර්මය තමාගේ ශක්තිවූ පරිද්දෙන් දියයුතු විපාක දුන් බැවින් යම් මරණයක්වේද ඒ මරණය සුගති දුර්ගති දෙක්හි පින් පව් ගෙවීමෙන් වන මරණ නම්-ඒ එසේමැයි. සැපවූ ආහාරාදි ප්‍රත්‍යය ඇතත් වර්තමාන

කාලය බඳුවූ සියක් අවුරුද්දම ආයු ඇත්තාවූ කාලයක පණස් අවුරුදු පමණ ආයු ලැබීමට සුදුසු කර්මයකින් උපන්නාහට පණස් අවුරුදු කෙළවර වන මරණය පින් ගෙවීමෙන් වන මරණ නමැයි දතයුතුයි. තවද දෙවියන්ට මෙන් ගති සම්පත්තියද ප්‍රථම කල්පිකයන්ට මෙන් කාල සම්පත්තියද උතුරුකුරු දිවයින් වාසීන්ට මෙන් ආහාර සම්පත්තියද සැපදායක ශීතෝෂ්ණ සංඛ්‍යාත සෘතු සම්පත්තියද සුදුසු සමවයසහි පිහිටි නිරෝගී මව්පියන්ගේ ශුක්‍ර ශ්‍රෝණිත සම්පත්තියද නොලැබීමෙන් වර්තමාන කාලයෙහි පුරුෂයන්ට මෙන් සියයක් අවුරුදු පමණවූ ආයු ගෙවීමෙන් යම් මරණයක් වේද ඒ මරණය ආයු ගෙවීමෙන් වන මරණනම්. මෙහි වනාහි ආයු සංස්කාරය සෘතු භොජනාදි සම්පත් වැඩීමෙන් වැඩිවන්නේය. පිරිහීමෙන් පිරිහී යන්නේය. එහෙයින් සියක් අවුරුද්දට ආයු ඇතිකල සියක් අවුරුදු ආයුස දෙන ජනක කර්මයකින් උපන්නාහට පින් ඇතත් මනා සෘතු භොජනාදිය නොලැබීමෙන් ආයු ගෙවී මරණය වන්නේය. ඒ මරණය ආයු ක්ෂය මරණ නම් වන්නේයි-දූසිමාරය, කලාබු රජය, නන්ද යක්ෂයා, නන්දමානවකයා, යනාදි පාපතරයන්ට මෙන් ඒ කර්මය කළ ක්ෂණයෙහිම ඒ භවයෙන් චුතවන්ට සමර්ථවූ දෘෂ්ට ධර්ම වේදනීය උපච්ඡේදක කර්ම නමැති ශස්ත්‍රයෙන් සිඳිනාලද ජීවිතෙන්ද්‍රිය ඇති සත්වයන්ට හෝ ආයුධ ප්‍රහාරාදි උපක්‍රමයෙන් හෝ පූර්වජනිත උපච්ඡේදක කර්මයෙන් සිඳිනලද කර්ම ඇත්තවුන්ට චිත්තප්‍රදූෂය ඇති මනොපදොසික දෙවියන්ට හෝ ක්‍රීඩාවෙන් ප්‍රමාදවන ඛිඩ්ඩාපදූෂික දෙවියන්ට හෝ යම් මරණයක් වේද ඒ මරණය අකාලයෙහි වන මරණ නම් වන්නේය, ඒ අකාල මරණය පුණ්‍ය ක්ෂය මරණය, ආයු ක්ෂය මරණය, උපක්‍රම මරණය, යන ප්‍රභෙද ඇත්තාවූ සියලුම මරණයෝ යථොක්ත ජීවිතෙන්ද්‍රිය පරම්පරාවගේ සිඳීමෙන් වන මරණයෙන් සංග්‍රහ කරණලද්දාහුය. මෙසේ ජීවිතෙන්ද්‍රිය පරම්පරාව සිඳීමයයි කියනලද මරණය සිහිකිරීම "මරණ සතිය" නමැයි දතයුතු. ඒ මරණ සතිය භාවනා වශයෙන් වඩනු කැමතිවූ රහසිගත විවේක ස්ථානයක හුන්නාවූ ඇතුළත්හි කරණලද සිහි ඇත්තාවූ යොගාවචරහු විසින් මරණය වන්නේය. ජීවිතෙන්ද්‍රිය සිඳෙන්නේයයි කියා හෝ මරණය මරණයයි කියා හෝ උපායෙන් යුක්තව මරණය අරමුනුකොට පවත්නා සිහිය පැවැත්විය යුත්තේය, ඒ එසේමැයි. සමෘති සංවේගය, නුවණය, යන මොවුන් නොඑළවා අයොනිසොමනස්කාරයෙන් යුක්තව මරණ සතිය පවත්වන්නාහට ප්‍රිය පුත්‍රයාගේ මරණය සිහිකිරීමෙහි වැදූ මවට උපදනා ශෝකය වැනිවූ බලවත් ශෝකය තමහට කැමති ජනයාගේ මරණය සිහිකිරීමෙහි උපදනේය. සතුරෙකුට සතුරෙකුගේ මරණය සිහි කිරීමෙහි උපදනා ප්‍රීතිය වැනිවූ බලවත් ප්‍රීතිය තමහට වෛරී ජනයන්ගේ මරණය සිහිකිරීමෙහි උපදනේය. සොහොන් ගොව්වෙකුට නිතර මළ සිරුරු දැක්මෙන් සංවෙග නූපදනාක්මෙන් මධ්‍යස්ථ ජනයාගේ මරණය සිහිකිරීමෙහි සංවේග නොඋපදනේය. තමාගේ මරණය සිහිකරණු ලබන්නො

කුව ඔසවාගත් කඩු ඇති වධකයෙකු දුටුකලක්මෙන් මහත් භය උපදන්නේය. ඒ ශොක සංතොෂයන්ගේ ඉපදීමය සංවෙග නොඉපදීමය, භය ඉපදීමය යන මේ සියල්ල සමෘති සංවෙග ප්‍රඥා යන මොවුන්ගෙන් වෙන්වීමෙන්ම වන්නේය. යම් හෙයකින් යොනිසොමනස්කාර සංඛ්‍යාතවූ සමෘති සංවෙග ප්‍රඥා යන මොවුන්ගෙන් වෙන්වීමෙන්ම වන්නේය. යම් හෙයකින් යොනිසො මනස්කාර සංඛ්‍යාතවූ සමෘති සංවෙග ප්‍රඥාවන්ගේ එළවීමෙන් යුක්තව මරණය සිහිකරන්නාහට මේ දොෂයෝ නොවෙද්ද, එහෙයින් අරණ්‍ය සුසානාදී ඒ ඒ තන්හි සොර සතුරු චණ්ඩ ව්‍යාඝ්‍රාදීන් විසින් මරාදමනලද සත්වයන්ද තම තමන්ගේ කාමානුරූප පරිද්දෙන් මළ සත්වයන්ද බලා පෙර දක්නාලද සම්පත් ඇති මළ සතුන්ගේ මරණය සිහිකොට සිහියද සංවෙගයද නුවණද එලවා ඒකාන්තයෙන් මරණය වන්නේය යනාදී ක්‍රමයෙන් මනසකාරය පැවැත්විය යුත්තේසි. මෙසේ මරණ සතිය පවත්වන්නේ නුවණින් පවත්වන්නේය, උපායෙන් පවත්වන්නේය යන අර්ථය වන්නේසි. මෙසේ පවත්වන්නාවූ තියුණු නුවණැති සමහරෙකුට පඤ්ච නීවරණයෝ මැඩපවත්නාහුය මරණය අරමුණුකොට පවත්නා සිහිය පිහිටන්නීය. උපචාර ධ්‍යානයට පැමිණි කම්සථානද වන්නේය. යමෙකුට වනාහි මෙපමණකින් කමටහන් උපචාර ධ්‍යානයට නොපැමිණෙන්නේ වීනම් ඔහු විසින් මරණය එළඹ සිටිනා සතුරෙකු වශයෙන්ද, සම්පත්තිය විපත්තියට පැමිණීම වශයෙන්ද, අනුන්ගේ මරණය තමහට එළවා නිදර්ශන කිරීම් වශයෙන්ද, ශරීරය බොහෝදෙනෙකුට සාධාරණ වශයෙන්ද ආයුසය අප්‍රශයින් දුර්වල වශයෙන්ද අසවල් කාරණයෙන් මරණය වෙයි යන නියත මරණ නිමිත්තක් නැති වශයෙන්ද, වර්තමාන කාලයෙහි සියක් අවුරුදු පරමායුෂ යන කාලපරිච්ඡෙද වශයෙන්ද ක්ෂණ කාලය ඉතා ස්වල්ප වශයෙන්දැයි යන අට පරිද්දෙන්ම මරණය සිහිකටයුත්තේසි. ඒ අට කාරණයන් අතුරෙන් වධකයෙක් එළඹ සිටිනා වශයෙන් කෙසේ මරණය සිහිකටයුතුදයත්, යම්සේ මොහුගේ හිස කපාලමියි කඩුව ඔසවා බෙල්ලෙහි පහරණාකාරයෙන් ලඟ සිටි වධකයා එළඹ සිටින්නේ නම් වේද එපරිද්දෙන් මරණයද එළඹ සිටින්නේමයයි සිහිකටයුත්තේසි. කුමක් හෙයින්දයත් මරණය උත්පත්තිය හා සමඟ ආ හෙයින්ද ජීවිතය පැහැරගන්නා හෙයින්ද, නිරන්තරයෙන් එළඹ සිටීන්නේයයි දතයුතුයි. යම්සේ හයි බිම්මල පොළොවෙන් පැන නගින්නාහු මුදුනෙන් පස්ගෙනම නැගේද, එපරිද්දෙන්ම මේ සත්වයෝ උපදනාහු ජරාව හා මරණය ගෙනම උපදනාහු වෙති, ඒ එසේමැයි. මේ සත්වයාගේ ප්‍රතිසන්ධි විඤ්ඤාණය උත්පාද ක්ෂණයට අනතුරුවම ස්ථිතික්ෂණ සංඛ්‍යාතවූ ජරාවට පැමිණ පර්වත මස්තකයෙන් වැටුනා ගලක් මෙන් ප්‍රතිසන්ධි විඤ්ඤාණය සමග යෙදුනාවූ වෙදනා සංඥා සංසකාර යන අවශෙෂ සකන්ධත්‍රය හා සමග බිඳීයාමයයි කියනලද මරණයට මවිකුස උපන් ක්ෂණය

කින් පැමිණෙන්නේයි. මෙසේ ක්ෂණික මරණය ප්‍රතිසන්ධි චිත්තය හා සමග මේ භවයට ආයේය උපන් සත්ත්වයෙකුට වනාහි ඒකාන්තයෙන් මරණය විය යුතු ස්වභාව ධර්මයක් බැවින් මෙතන්හි දක්වනලද ජීවිතෙන්ද්‍රිය පරම්පරාවගේ සිඳීමයයි කියනලද මරණයද උත්පත්තිය හා සමගම ආයේයයි දතයුත්තේයි. එහෙයින් උදාවූ තැන් පටන් ගිය ගිය තැනින් මඳකුදු නොනැවතී අස්තයටම අභිමුඛව යන්නාවූ සූර්යයා මෙන් මේ සත්ත්ව තෙමේද උපන්තැන් පටන් මරණයටම අභිමුඛව යන්නේයි. යම්සේ ජීවිතයෙන් බස්නාවූ කුඩා ගංගා තොමෝ ශීඝ්‍රව ශ්‍රොතස් ඇත්තී සැඩ පහරෙහි වැටුන තෘණ පර්ණාදීන් වහා යටිගං බලාගෙන වේගයෙන් බැසයන්නීවේද එපරිද්දෙන්ම මේ සත්ත්වතෙමේ මඳකුදු නොනවත්නාහු මරණයටම අභිමුඛව යන්නේයි-ඒ එසේමැයි.

යමේක රත්තිංපඨමං-ගබ්භෙවසති මානවො
අබ්භුට්ඨිතො වසයති-සගච්ඡං න නිවත්තති

මෙහි අදහසනම්:-මව්කුස පිළිසිඳගන්නා සත්ත්වතෙම පිළිසිඳගත් කෙණෙහි එක් රැයක් මව්කුස වෙසේද, ඒ පළමුවන ක්ෂණයෙහි පටන් අහස්කුස නැංගාවූ මේඝයක් නොනැවත අනික් දිසාවකට අභිමුඛ වන්නාක්මෙන් මරණයට අභිමුඛවම සයනය කරන්නේය යනුයි. මෙසේ යන ඒ සත්ත්වයා හට ග්‍රීෂ්මයෙන් වියලෙන්නාවූ පර්වතයෙන් බස්නා කුඩා ගංගාවන්ගේ ක්ෂයවියාමක්මෙන්ද, රාත්‍රියෙහි අපොධාතු රසයෙන් තෙත්වී ගිය වණට බන්ධන ඇති අඹ දඹ ඵලයන්ගේ උදූසන ගසින් බිම වැටීමක් මෙන්ද, දඬු මුගුරෙන් පහරදුන් මැටි භාජනයන්ගේ බිඳීමක් මෙන්ද හිරු රැසින් පහළ පිනි බින්දූන්ගේ විනාශයක් මෙන්ද මරණයම ආසන්න වන්නේය, ඒ එසේමැයි.

1. අච්චයන්ති අහොරත්තං-ජීවිතං උපරුජ්ඣති
   ආයුඛීයති මච්චානං-කුන්නදීනංව ඔදකං

2. ඵලානමිව පක්කානං-නිච්චං පතනතොභයං
   එවං ජාතාන මච්චානං-නිච්චං මරණතො භයං,

3. යථාපි කුම්භ කාරස්ස-කතං මත්තික භාජනං
   සබ්බං භෙදන පරියන්තං-එවං මච්චාන ජීවිතං,

4. උස්සාවොව තිණග්ගම්හි-සුරියස්සුග්ගමනංපති,
   එවමායු මනුස්සානං-මාමං අම්ම නිවාරය,

1. යම් හෙයකින් දිවා රාත්‍රීහු ඉක්මෙන්නාහුද එමෙන්ම තමාගේ ආයුෂද දවසින් දවස ගෙවියන්නේය-ජීවිතය නිරුද්ධවන්නේය-පර්වතයකින් ගලා බස්නා කුඩා ගංගාවන්ගේ ජලය සිඳී යන්නාක්මෙන් මනුෂ්‍යයන්ගේ ආයුෂද ගෙවී යන්නේය යනු මෙහි ප්‍රථම ගාථාවේ අදහසයි.

2. පැසුණු ඉදුණු අඹ දඹ යනාදි ඵලයන්ගේ උදෑසන්හි වැටීමෙන් රුක් හිමියන්ට යම්සේ භය උපදීද එමෙන්ම උපන් සත්වයන්ට හැම වේලෙහිම මරණින් භය උපදනේය යනු මේ දෙවන ගාථාවේ අදහසයි.

3. කුඹලා විසින් ඉදිකරණලද සියලු මැටි බඳුන් රාශිය බිඳීම කෙළවරකොට ඇත්තේවේද එමෙන්ම උපන් සත්වයන්ගේ ජීවිතයත් මරණය අවසන්කොට ඇත්තේය යනු මෙහි තුන්වන ගාථාවේ අභිප්‍රායයි.

4. යම්සේ හිරු උදාවීම හේතුකොටගෙන තණපත් අග පිණි බිඳ සිඳීයේද (විනාශවී යේද) එමෙන්ම මනුෂ්‍යයන්ගේ ආයුෂයත් විනාශවී යන්නේය-එබැවින් මෑතියන් වහන්ස මාගේ ප්‍රව්‍රජ්‍යාව නොවළක්වනු මැනවි යනු සතරවෙනි ගාථාවේ අභිප්‍රායයි.

මෙසේ උත්පත්තිය හා සමග ආවාවූ මේ "මරණ" නමැති සතුරා දිවි පැහැරගෙනම මිස නොවලකින්නේමයයි දතයුතුයි. මේ මරණ තෙමේ උපන් භවයෙන් ගිලිහීයාම ලක්‍ෂණකොට ඇත්තේය. ඒ භවයෙන් වෙන්වීම කෘත්‍යයකොට ඇත්තේය, විනාශවීයාම ආකාරකොට ඇත්තේය. මේ මරණය දුක්වන්නාක් මෙන්ම කායික චෛතසික දුඃඛයන්ට කාරණා වන බැවින් දුකැයි වදාරණලදී. එබැවින් මේ මරණය උත්පත්තිය හා සමග ආ හෙයින්ද, දිවි පැහැරගන්නා හෙයින්ද ඔසවාගත් කඩුවක් ඇති වධකයකුමෙන් එළඹ සිටිනේයයි මෙසේ වධකයෙකුගේ එළඹ සිටීමක් මෙන් මරණය සිහිකටයුත්තේය.

ඉක්බිති සම්පත්තිහුගේ විපත්ති වශයෙන් මරණය කෙසේ සිහිකට යුතුදයත්, මේ ලෝකයෙහි හිරණ්‍ය ස්වර්ණ මුක්තාමාණික්‍ය ග්‍රාම ක්‍ෂෙත්‍රාදි සියලු සම්පත්තීහුම යම්තාක් විපත්තියකින් මැඩ නොපවතීනම් ඒතාක් හොබනේමය. එතකුදුවුවත් විපත්තියෙන් මැඩ නොපවත්නා සම්පත්තියෙක් නම් කිසි තැනෙක්හි නැත්තේමය-ඒ එසේමයි.

1 සකලං මෙදිනිං භුත්වා–දත්වා කොටිසතං සුඛී
අඩ්ඪාමලක මත්තස්ස–අන්තෙ ඉස්සරතංගතො-

2 තෙනෙවදෙහ බන්ධෙන–පුඤ්ඤම්හි ඛය මාගතෙ
මරණාභිමුඛො සොපි–අසොකො සොකමාගතො–

1 නිශ්ශෝකවූ ඒ අශෝක මහරජු පවා සියලු පොළොව අනුභව කොට මහවත් වීපචක්‍රවර්ති රාජ්‍යයකොට එකලසිය ගණන් වස්තු වියදම් කොට සුවාසූ දහසක් විහාර කරවා එක දවස එකවිට සුවාසූදහසක් විහාර පූජා කරවා බුදුසසුන බබුළුවා මහදන්දී දෙවියන්ට බඳු ඓශ්වර්යයෙන් හා ආධි ප්‍රත්‍යයෙන් යුවපත්වූවාහුද කෙළවර පින් ගෙවීමට ගියකල මරණයට අභිමුඛවූවාහු එබෙහෙත් පිණිස යොදනලද නෙල්ලි බිකක් පමණට අධිපති බවට ගියාහු එම ශරීරයෙන් හෙවත් ඒ දෙවියන්ට බඳු මහත් ඓශ්වර්ය සම්පත්තියෙන් සන්තර්පනය කරණු ලැබූ ශරීරයෙන්ම මරණ ශෝකයට පත්වූයේය.

තවද සකල සත්ව සමූහයාගේ නිරෝගිභාවය ව්‍යාධිය කෙළවරකොට ඇත්තේය. සියලු යෞවනභාවය ජරාව කෙළවරකොට ඇත්තේය. එපරිද්දෙන්ම සියලු ජීවිතය මරනය කෙළවරකොට අත්තේය. එහෙයින් මේ සියලු ලොකයා ඉපදීම් සංඛ්‍යාත ජාති දුක පසු පස්සේ යන්නේය. දිරීම් සංඛ්‍යාත ජරා දුකින් වැළඳගන්නා ලද්දේය, ලෙඩවීම් සංඛ්‍යාත ව්‍යාධි දුකින් මඩනාලද්දේය, ජීවිතෙන්ද්‍රිය විනාශ සංඛ්‍යාත මරණ දුකින් පහරණලද්දේයයි දතයුතුයි.

"මරණන්තිකාහි ශාරීරිකා වේදනා පටිවාතෙ ගහිතං ආදිත්ත තිණුක්කා විය ශරීරං නිදහන්ති නරක නිමිත්තාදීනං උපට්ඨාන කාලෙබලව දෙමනස්සං උප්පජ්ජති."

මෙහි අදහස මෙසේයි, මරණය අවසානකොට ඇත්තාවූ ශරීරයෙහි හටගන්නා වෙදනාවෝ උඩු සුළඟෙහි ගන්නාලද හෙවත් අල්ලාගන්නා ලද ගිනිගෙන දිලිසෙන තනහුලු මෙන් ශරීරය දවති. නරක නිමිති ආදීන් වැටහෙන්නාවූ කල බලවත් දෞර්මනස්‍ය උපදනේය යනුයි-මෙසේ මිප්‍රකාර දුඃඛයන්ට වස්තුවන බැවින් දුකැයි දතයුතුයි.

තවද පාප කර්මය, කර්ම නිමිත්තය, ගති නිමිත්තයයි කියනලද මරණ කාලයෙහි එළඹ සිටි අකුසල විපාකාලම්බනය නැවත නැවත දක්නාවූ පව්ටු හැසිරීම් ඇති සත්වයා හටද, මැරෙන්නාවූ සත්වයා හටද, සිතෙහි හට ගන්නාවූ යම් දුකක්වේද, සාමාන්‍ය වශයෙන් විඳිනු ලබන මර්මස්ථාන ඇත්තාවූ සියලු සත්වයන් හටද හන්දිපත් ගැලවීම් ආදීවූ ශරීරයෙහි හටගන්නාවූ නොඉවසිය හැකිවූ බෙහෙදින් පිළියම් නොකොටහැකිවූ යම් දුකක් වේද, ඒ දුක් සමූහයට මේ මරණය තෙම යම් හෙයකින් වස්තුවේද ඒ කාරණයෙන් මේ මරණය දුකැයි කියාම වදාළසේක.

මේ අදහස ප්‍රකාශිත ගාථා පඞ්ක්තිය මෙසේය :-

1. පාපස්ස පාප කම්මාදි-නිමිත්තමනුපස්සතො
   භද්දස්සා පසතන්තස්ස-වියොගං පියවත්ථුකං
2. මීයමානස්ස යං දුක්ඛං-මානසං අවිසෙසතො
   සබ්බෙසංචාපි යං සන්ධි-බන්ධනච්ඡේද නාදිකං
   විතුජ්ජමාන ධම්මානං-හොති දුක්ඛං ශරීරජං
3. අසය්හ මප්පතීකාරං-දුක්ඛස්ස තස්සිදං යතො
   මරණං වත්ථු තෙනෙතං-දුක්ඛමිච්චෙව භාසිතං

මරණය පිළිබඳ තොරතුරු සැකෙවින් මෙසේ නුවණින් සලකා සංවෙග උපදවාගත පාපයට ලජ්ජා භය සහ ශ්‍රද්ධාශීලාදී ශාසනික යහපත් ගුණධර්මයන්හි මනාසේ පිහිටා ආනම ධර්මය දැන ඉගෙන කල්‍යාණ මිත්‍ර ආශ්‍රයෙන් සූක්ෂමව මනාසේ බුද්ධාගම අදහා සංසාර දුක්ඛයන් මුක්තවීමට (මිදීමට) සතතයෙන් උත්සාහ කටයුත්තේය. ඒ යුතුකම සම්පූර්ණකර ගැණීම සඳහා අද අදම ආරම්භ වීර්‍ය කටයුතුයි. කුමක් හෙයින්දයත්?

මරණය අද්ද සෙටද කියා දන්නේ කව්ද? සමස්තලෝකයෙහි සියලු සත්වයන් යටපත්කරගන්නා හෙයින් මහත් සේනාවක් ඇති ඒ මාරයා අභිමුඛ වූකලී ඔහුට ඇපවන්නේ කව්ද? නොහොත් තව මෙතෙක් කලක් මැරෙන්ට එපාය, එතෙක් කල් මොහු වෙනුවට මම ඇපකාරයෙක් වෙමියි කියා ඇපවන කෙනෙකුදු නැත්තේය. ඒකාන්තයෙන්ම මරණයට පත් වන්නේමය, එසේ මැරී පරලොව යතුවූ විට අධික තෘෂ්ණාවෙන් සපයා ගත් වස්තුව සිය ගෙදරම නවතින්නේය, කහවනුවක්, මස්සක්, තුට්ටුවක්, ශත බාගයක් පමණවත් ගෙනයාමක් නැත්තේය, තම ගෙදරම තබා යන්නේය. නෑදෑ මිත්‍රයෝ සොහොන් භූමියට පමණක් පසු පස්සේ ගමන් කරති. ඉන් එහාට ඔහු සමග අඩියක් පමණවත් යාමක් නැත්තේය. තමා විසින් කරනලද කුශලාකුශල කර්මයෝ පමණක් කැටුව යන්නාහ ඒ කුශලා කුශල කර්මයෝම සවකිය අයිතිය වන්නාහ. සෙවනැල්ලක් මෙන් නොනැවතී කැටුවම යන්නාහ. එහෙයින් මේ අසාරවූ සසරින් මිදී සාරවත්වූ නිවන් සැප ලබාගන්නා පිණිස සාරවත් තථාගත ධර්මමාර්ගයෙහි අධික ශ්‍රද්ධාවෙන්, භක්තියෙන්, ගෞරවයෙන් පිළිපැදීමට නොහොත් ආගම අදහාගැනීම පිණිස අද අදම ප්‍රාරම්භ වීර්යය කටයුතුයි. හෙට අනික්දාට කල්දැමීම නොකටයුත්තේය. (One today is worth two tomorrows) හෙටදින දෙකකට වඩා අද එක දින උතුම්, යන මේ ඉංග්‍රීසි වචන පිතෙන්ද ස්ඵුටයි.

අ ද අ ද එයි මරු පින්කර ග න්නේ
කෙලෙස ද සෙට මරු නොඑති සිත න්නේ
කිකල ද මහසෙන් මරු ඇප ව න්නේ
කුමට ද කුසලට කම්මැලි ව න්නේ

ත්‍රිපිටකධාරි සුනෙත්‍රපාද විසිදුගම මහා සවාමීන්ද්‍රයාණන් වහන්සේ විසින් විරචිත "ලෝවැඩ සඟරා" කාව්‍යයෙන්ද ප්‍රකාශවන යහපත් අවවාදය සිත තබාගෙන අදම දාන ශීල භාවනාදී සුචරිත ක්‍රියාවන්හි යෙදී වාසයකරන්නට සිත තබාගත යුතුයි.

මධුවා මඤ්ඤති බාලො - යාව පාපං නපච්චති
යදාච පච්චති පාපං - අථබාලො දුක්ඛං නිගච්ඡති,

යන මේ ගාථා ධර්මයෙන්ද ප්‍රකාශවන්නේ තමා විසින් කරනලද පාප කර්මයෙහි විපාක වාරය නොපැමිණෙනතෙක් අඥානයා පව්කම් කිරීම මීසේ මධුරකොට සලකන්නේය, නොහොත් බොහෝසේම සතුටින් පව් කරන්නේය. නමුත් යම් දවසක ඒ කරනලද පාපකර්මවල විපාක විඳිය යුතු වාරය පැමිණියේද එකල්හි ඒ අඥාන පව්කාරයා ගිනි මැලයක් සේ මහත්වූ දුකට පත්වන්නේය යනුයි. මේ කාරණා නුවණින් විමසා බලා පාපයට ලජ්ජා භය උපදවාගෙන ආගමානුකූල උතුම් ශීලාචාර ගුණ ධර්මයන් වර්ධනය කරගැනීමෙහි ප්‍රමාද නොවිය යුතුයි. එසේ කුසල ක්‍රියාවන්හි පමාවීම ඒකාන්තයෙන්ම නුසුදුසු වන්නේය. මහත්වූ අප්‍රමාද ගුණධර්මයම පෙරටු කොට ගතයුත්තේමය.

ඔකාස මජ්ජ මම නත්ථි සුවෙ කරිස්සං
ධම්මං ඉතිහලසතා කුසලප්පයොගෙ
නාලං තිය්ධසු තථා භුවනත්තයෙව
කාමං නවත්ථි මනුජො මරණා පමුත්තො

මට අද කුසල් කරන්නට අවකාශ නැත්තේය, ඒ දුන සීලාදී කුසල් දහම් සෙට (අනිද්ද) කරන්නෙමියි කියා කුසල්කිරීමෙහි මෙසේ අලසවීම සුදුසු නොවන්නේමය, කුමක් හෙයින්දයත් ? අතීතානාගත වර්තමාන යන කාලත්‍රයෙහිද ත්‍රිවිධ ලෝකයෙහිද මරණයෙන් මිදුනාවූ හෙවත් නොමැරෙන්නාවූ සත්වයෙක් ඒකාන්තයෙන්ම නැත්තේය. එහෙයින්, මහා යසස් ඇත්තාවූ මහා සම්මතාදි චක්‍රවර්ති රජදරුවෝද ජෝතිය, ජටිල, උග්ග, මෙණ්ඩක, පුණ්ණක ආදි ලොකයෙහි සිටි මහ පුණ්‍යවන්තයෝද, වාසුදෙව බලදෙව, භීමසේන, යුධිෂ්ඨිර, චානුරොධ, පියදස නම් මල්ලවය, යනාදී ලොක ප්‍රසිද්ධ වීර්‍යවන්තයෝද, පය මාපට ඇඟිල්ලෙන් විජයොත්පාය නම් පාකල මුගලන් මහ තෙරනුවන් ආදි ඍද්ධිමතුන්ද ශාරිපුත්‍ර ස්ථවිර ආදි මහා ප්‍රඥවන්තයෝද මරහුගේ වසඟයට පැමිණියෝය. සර්වඥ ඥාන වීර්‍ය බලයෙන්ම සියලු කෙලෙස් සතුරන් නසා චතුස්සත්‍යය අවබොධයෙන් ප්‍රත්‍යෙක සම්බොධියට පැමිණි පසේ බුදුවරයෝද, සුප්‍රතිෂ්ඨිත පාද තලාදි දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන් විසිතුරුවූ තම්බ නඛාදි අශීත්‍යානුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිතවූ ආශ්චර්‍ය අද්භූත රූප කාය සම්පත්තියකින් හා සවාසනා සර්ව ක්ලෙශ මර්දනය කරවූ හෙයින් සර්වාකාර සුපරිසුද්ධ ශීලස්කන්ධාදී ගුණ රත්නයෙන් සමෘද්ධ ධර්ම කාය සම්පත්තියකින්ද යුක්තවූ යස මහත්තතා, පුණ්‍යමහත්තතා, ථාම, ඉද්ධි, පඤ්ඤා, මහත්තතාදීන්ගෙන් පරතෙර පැමිණියාවූ අසදෘශවූ, අසමසමවූ, අප්‍රති පුද්ගලවූ, දීපදුත්තමවූ සම්‍යක් සම්බුද්ධ තථාගතයන්වහන්සේද වැස්සෙන් මහ ගිනි කඳක් නිවීයන පරිද්දෙන් මරණ නමැති වෘෂ්ටි නිපාතනයෙන් එකණෙහිම නිවීගියාහුය. මා වැනියන් කෙරෙහි කියනුම කවරේදැයි නුවණින් කල්පණාකොට අදම සුචරිතයෙහි යෙදීවාසය කිරීමට ඉටා ගතයුතුයි.

එසේ කුසල් කරන්නන් විසින් ප්‍රථමකොට රත්නත්‍රයෙහි ගුණ දැන පැහැදීමයයි කියනලද ශ්‍රද්ධාව උපදවාගතයුතුයි. මොහාන්ධකාරයෙන් අන්ධවූ සත්වයන්ට නුවණැස් උපදවාදී උත්තම සද්ධර්මමාර්ගයෙන් සත්වයන් සදාකාලික නිවන් පුර පමුණුවාලීම පිණිස අප තථාගතයන්වහන්සේ මහත්වූ සත්ව කරුණාවෙන් අනන්ත කාලයක් මුළුල්ලෙහි කාය ජීවිත දෙකම නොබලා අනන්ත දුක්ගෙන දශපාරමිතා පින් පුරා ලෞවිතුරා සර්වඥතාඥානයට පැමිණි වදාළසේක. කරුණා මෛත්‍රී ශීල සමාධි ආදි සියලුම උතුම් ගුණ සමූහයෙන් මවාලූ රූපයක් සමානවූ අර්ථ විද්‍යා ඥානාදි සියලුම උතුම් ප්‍රඥා සමූහයෙන් මවාලූ රූපයක් සමානවූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ අනන්ත ගුණ ඇති සේක, අනන්ත ප්‍රඥා ඇති සේක, අනන්ත ඍද්ධි බල පරාක්‍රම ඇතිසේක. වැඳුම් පිදුම් කළ පමණින්,

සිත් පහදවාගත් පමණින්, සිහිකළ පමණින්, ගෞරවයෙන් නාමය කී පමණින්, සත්වයන්ට සවර්ග මනුෂ්‍ය සම්පත් ගෙනදීමට සමර්ථවූ අනන්ත ගුණ ඇති ඒ තුන්ලෝ අග්‍ර මැණියන් වහන්සේ කෙරෙහි ගුණ දැන පැහැදීමෙන් උන්වහන්සේගේ උතුම් පිහිට පිළිගත යුත්තේය. හෙවත් සියලු සසර දුකින් මිදීම පිණිස බුදුන් හැර අන් පිහිටක් ඒකාන්තයෙන්ම නැති හෙයින් පළමුකොට ඒ උතුම් සරණ සිතතුළ මනාසේම පිහිටුවා ගතයුත්තේය. එසේම උන්වහන්සේ වදාළ ශ්‍රී සද්ධර්මය නම් සියලු සත්වයන්ගේ කෙලෙස් ගිනි නිවීමට අමෘත වර්ෂාවක් සමාන වන්නේය රාග විෂ පානයට දිව්‍ය ඖෂධයක් සමාන වන්නේය, ක්‍රොධ නමැති සර්ප විනාශයට දිව්‍ය මන්ත්‍රයක් සමාන න්නේය, මොහ නමැති අඳුරු දුරලීමට සූර්‍ය්‍යාලොකයක් සමාන වන්නේය, ඇසූ ඇසූවන්ට ප්‍රිය උපදවන්නේය, බැලූ බැලූවන්ට සන්තොෂයෙන් යුක්තවූ ප්‍රඥව උපදවන්නේය, දහස් ගණන් නුවණැස් උපදවන්නේය. එහෙයින් සත්පුරුෂයිනි, පිරිසිදු කිරීමට අතිශයින්ම දුෂ්කරවූ මේ සිත සද්ධර්මය ආශ්‍රය කිරීමෙන්ම සිරිසිදු කරගත යුතුයි.

එසේම තුන්වන වරට සඟරුවන් ගුණ දැන එයි සිත පහදවාගත යුතුයි. තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සංඝයාවූ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල මහා සංඝරත්නය ලොවට උතුම් පින් කෙතක්වූයේය. ශීල සමාධි භාවනා කාරුණ්‍ය මෛත්‍රී ආදී උත්තම ශාසතික ගුණ ධර්මයන්ගෙන් අලඞ්කාරවූ ඒ උතුම් සඟ රුවන් පින්පල සල්කා සරණ යායුතුය. මෙමසේ රත්නත්‍රයේ ගුණ දැන සලකා ශ්‍රද්ධාව උපදවා ඒ උතුම් තුනුරුවන් මාගේ සියලු අභිවෘද්ධියට සියලු සසර දුක් ගෙවා ගැණීමට එකම උතුම් පිහිටක්කොට ගණිමියි ස්ථිරව සිත තබාගෙන දෙව්මිනිස් සැප කෙළවර ශාන්ත සුඛ අමාමහ නිවන් සම්පත් ලබාගන්නට දිවා රෑ දෙක්හි උට්ඨාන වීර්‍ය්‍යයෙන් ක්‍රියා කටයුතු බැව් සියලුදෙනා විසින්ම සිත්වල තබාගතයුතුයි. සාධු! සාධු! සාධු !!!

නිබ්බාන පච්චයොහොතු.

# දැන්වීමයි.

"ශ්‍රී සද්ධර්මොවාදය" නමැති මෙම ධර්ම පොත් මුළු ලක්දිවම වාගේ පැතිර යන බැව් නිසැකව කියමු. මෙම සත්ව්‍යාපාරයට අදම රු. 1 ක් එවා පොත් ලබාගනිත්වා. මාස්පතා කාණ්ඩ තුන හතර බැගින් එවනු ලැබේ. පොත් ලබාගැනීමට අනපසුකර පසුව පශ්චාත්තාප නොවන ලෙස ඉල්ලමු.

Rev. G. Dharmaloka,
Vidarsana Vihare,
Ambalanpitiya
Kurunegala.


## අපේ ප්‍රධාන දායක පිරිස.

ඉඩ නොමැත්තෙතන් සියළු නාමයන් නොදන්වා
අනවකාශ බැවින් මෙසේ පළදීමු.

(පසුගිය කාණ්ඩ හා සම්බන්ධයි.)

**කටුපොත.**-ඩබ්ලිව්. තෝමස් සිල්වා මහත්මයා ප්‍රධාන දායක පිරිස, 5, රු. 2යි, **දෙනියාය.**-කේ. ඒ. පී. අබේගුණවර්ධන මයා සහ දායක පිරිස 12, රු. 2-50යි. **කැස්බෑව.**—වාගශෝධය සමිතිය, රු. 2යි. **ගාල්ල.**—ජ්. අබයනායක මයා සහ දායක පිරිස 7, රු. 2-50යි. **මාහුලේ දිවිල්ල.**—ඩී. යූ. බොධිතුංග මයා සහ පිරිස 4, රු. 2යි. **පරකඩුව.**-බොගහමලුව බී. ජී. බබ්බුසිංහ මයා සහ පිරිස 71, ලැබුනා රු. 6-66යි. **නාවලපිටිය.**—ඇල්. පී. පොඩිසිංහ මයා සහ දායක පිරිස 41, රු. 12-00යි. **වටගොඩ.**—ඇස්. ඇන්. ජයවික්‍රම මයා සහ දායක පිරිස 13, රු. 9යි. **හෝල්බෲක්.**—ලැන්චින් වීරසූරිය මයා සහ දායක පිරිස 20, රු. 10යි. **රත්ගල්ල.**—කේ. ජේ. සිරිවර්ධන මයා සහ දායක පිරිස 13, රු. 5යි. **කොළඹ කොටුව.**—ඇම්. ජී. සමරසේන මයා සහ දායක පිරිස 26, රු. 12-20යි. **මහගොඩකන්ද බද්දේගම.**—වයි. ඉන්දසර ස්ථවිරයන්වහන්සේ සහ දායක පිරිස, 17, රු. 12යි. **වදුරඹ.**—යූ. ඉන්දරතන ස්ථවිරයන් වහන්සේ සහ දායක පිරිස 10, රු. 6-10යි. **හංවැල්ල.**—බී. ඇම්. මුනිදාස මයා සහ පිරිස 26, රු. 4යි. **මාතලේ.**—ආර්. අබේවික්‍රම මයා සහ දායක පිරිස 2, රු. 2යි. **හක්මණ.**—ජී. ඇම්. ද සිල්වා මයා සහ දායක පිරිස 24, රු. 5යි. **පනාගොඩ, ගල්පත-කළුතර.**-මුනසිංහගේ ජුවන් අප්පුහාමි සහ පිරිස 16, රු. 4යි. **නානුඔය.**—සී. පී. පොන්සේකා මයා සහ පිරිස 29, රු. 20යි. **නුවරඑළිය.**—ජේ. දෙන් චාර්ල්ස් අප්පුහාමි රු. 1යි. **මාතලේ.**—ඇන්. ඒ. ජෝන් ප්‍රේරා මයා සහ දායක පිරිස 10, රු. 14-50යි. **හොරොව්පතාන, ත්‍රිකුනාමලය.**—එච්. කෙ. නිකුලස් අප්පුහාමි මුදලාලි මයා සහ පිරිස 18, රු. 12-50යි. **පාදුක්ක.**—ඇම්. පී. පෙරේරා මයා සහ පිරිස 12 රු. 2-50යි. **කොටුව, කොළඹ.**—යූ. කේ. ඒ. ද සිල්වා මයා රු. 1යි. **වැල්ලවත්ත.**—ඩබ්ලිව්. කේ. අල්විස් මයා සහ පිරිස 4, රු. 2-50. **මරදාන.**—ඇස්. ඕදිරිස් ප්‍රනාන්දු මයා රු. 1යි. **කිතුලගල.**—ඩබ්ලිව්. ඒ. හෙන්ද්‍රික් අප්පුහාමි සහ පිරිස 16, රු. 7-60යි. **බදුල්ල**—ඩී. ජේ. අප්පුහාමි උපාසක මයා සහ පිරිස 10, රු. 10යි, **සමියන්තොට පරුස්සැල්ල**—ඇම්. ඇම්. දෙන් කරෝලිස් සිල්වා මයා රු. 1යි. **ඔබල්පිටිය.**—ඩී. සී. කේ. චාර්ලිස් අප්පු එම එච්. පී. දෙන් දියෝනිස් අප්පුහාමි රු. 1යි. එම ඇල්. පී. පෙරේරා කොන්දෙස්තර් මයා රු. 1යි. එම කමල් ප්‍රනාන්දු මයා රු. 1යි. **දෙහිවල.**—ඩබ්ලිව්. ඇල්. අල්විස් මයා සහ පිරිස 9, රු. 7යි. **කොළඹ කුරුඳුවත්ත.**—එච්. ජී. සරනේලිස් මයා සහ පිරිස 22, රු. 13යි. **හන්දෙසස.**—ඇන්. ඇල්. ඇස්. සිල්වා මයා සහ පිරිස 21, රු. 6-10යි.--(46 වෙනි කලාපය බලනු.)

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු